# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2397/34 - 2024 අගෝස්තු මස 14 වැනි බදාදා - 2024.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ (13) වන අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ පුරප්පාඩුවක් පිරවීම

අංක 07 - ගාල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත්කරන ලද **මලිගස්පේ කෝරලේගේ නලින් මනූෂ නානායක්කාර** මහතා සමගි ජන බලවේගය පක්ෂයෙන් පහකිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අංක SC/(EXPULSION) No. 02/2023 දරන පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කිරීම හේතුකොට ගෙන නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, ඉහත කී පනතේ 64(1) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13)(ආ) අනුව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි මෙම පුරප්පාඩුව පුරවන ලෙස එකී මන්ත්‍රීවරයා තෝරා පත්කර ගන්නා ලද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(1) වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබූ හෙයින් ද;

තේරීම්භාර නිලධරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13)(ආ) අනුව්‍යවස්ථාවට අනුව හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වන වගන්තිය යටතේ ක්‍රියාකරමින් එකී මැතිවරණ කොට්ඨාසය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස **බන්දුල ලාල් බණ්ඩාරිගොඩ** මහතා තෝරා පත්කරන ලද බව ප්‍රකාශයට පත්කර, එම පනතේ පළමුවන උපලේඛනයේ "ක" ආකෘතිය මත, මැතිවරණ කොමිෂන් සභාවට වාර්තාව ඉදිරිපත් කොට ඇති හෙයින් ද;

1A - G 42481— 24 (2024/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ඉහත කී **මලිගස්පේ කෝරලේගේ නලින් මනූෂ නානායක්කාර** මහතා සමගි ජන බලවේගය පක්ෂයෙන් පහකිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අංක SC/(EXPULSION) No. 02/2023 දරන පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කිරීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම පිණිස අංක 07 - ගාල්ල මැතිවරණ කොට්ඨාසය සඳහා නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස **බන්දුල ලාල් බණ්ඩාරිගොඩ** මහතා තෝරාපත් කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 අගෝස්තු මස 14 වැනි දින,
රාජගිරිය.
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

EOG 08 - 0184

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.